කවරෙකු බංකොලොත්තු වූ පුද්ගලයකු අසල තම භාණ්ඩ තිබෙනු දුටුවේ ද සෙසු අයට වඩා එය(ගැනීම)ට වඩාත් සුදුසු වන්නේ ඔහුමය.

අබූ හුරෙයිරා -රළියල්ලාහු අන්හු-තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. කවරෙකු බංකොලොත්තු වූ පුද්ගලයකු අසල තම භාණ්ඩ තිබෙනු දුටුවේ ද, සෙසු අයට වඩා එය(ගැනීම)ට වඩාත් සුදුසු වන්නේ ඔහුමය.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

කවරෙකු යම් කෙනෙකුට භාණ්ඩයක් ණයට විකුණා හෝ භාරදී හෝ ණයට දී හෝ තිබුණේ නම් එසේ මිලට ගත් අය තම ණය නොගෙවාම බංකොලොත්තු වූ විට ඔහු සතුව භාණ්ඩ තිබෙනු දුටු විට එය ලබා ගැනීමේ අයිතිය පිරිනැමූ අය සතුය. වෙනත් අයට වඩා ඔහු එයට උරුමකම් පානු ඇත.

http://sunnah.global/hadeeth/si/show/5838